# දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය
# தேசப்பற்றுள்ள தேசிய இயக்கம்
# Patriotic National Movmenet

එක රටක්!-එක හඬක්!
ஒரே நாடு! – ஒரே குரல்!
*One country!-One voice!*

2022-06-20

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,

ප්‍රිය මහත්මයාණෙනි,

**වෛද්‍ය මොහොමඩ් සාෆි මහතා විසින් කැමැත්ත නොමැතිව මව්වරුන් වඳ භාවයට පත්කිරීම පිළිබඳව විනය පරීක්ෂණයක් පැවැත්වෙන අතරතුර ආයතන සංග්‍රහය උල්ලංඝනය කරමින් ජනමාධ්‍ය මගින් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම මගින් පරීක්ෂණයට බාධා එල්ල කිරීම පිළිබඳව**

වෛද්‍ය මොහොමඩ් සාෆි මහතාට එරෙහිව එල්ල වී ඇති චෝදනා පිළිබඳව විනය පරීක්ෂණ පැවැත්වීමේදී සහ ඊට අදාළ සෙසු ක්‍රියාමාර්ග ගැනීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සම්මත ක්‍රමවේදයන්ට පටහැනිව පක්ෂග්‍රාහීව ක්‍රියා කර ඇති බවට අප සංවිධානය විසින් ගරු අමාත්‍යවරයාට ද කරුණු දක්වා ඇත. මේ වන විට එසේ විනය ක්‍රියාමාර්ග නිසි පරිදි සිදු නොවීම නිසා චූදිතයාට හිඟ වැටුප් ගෙවීමට සිදුවී ඇති අතර ඒ මගින් ඔහු චෝදනා වලින් නිදහස් වූ බවක් ද සමාජගත වී ඇත. එම නිසා 800කට අධික වින්දිත මව්වරුන් බලවත් මානසික පීඩනයකට සහ අසහනයට පත්වී ඇත.

එවැනි තත්ත්වයක් තුළ චූදිතයා විසින් එම හිඟ වැටුප් විනය බලධාරීන්ට පරිත්‍යාග කිරීම මගින් විනය පරීක්ෂණයට බාධා එල්ල කිරීමට උත්සාහ කරන බවට ද මතයක් සමාජ ගත වී ඇත. එම තත්වය එසේ තිබියදී චූදිතයා විසින් සති අන්ත පුවත්පතකට (2022-06-19 අරුණ පුවත්පත) සම්මුඛ සාකච්ඡාවක් ලබාදෙමින් අදාල විනය ක්‍රියාමාර්ග වලට බලපෑම් එල්ලවිය හැකි ප්‍රකාශ සිදු කිරීම මගින් ආයතන සංග්‍රහය සහ වෘත්තීය ආචාර ධර්ම උල්ලංඝණය වේ.

එම නිසා අදාළ පරීක්ෂණ පිළිබඳව මහජන විශ්වාශය තහවුරු කිරීම සඳහා එවැනි ක්‍රියාවල නියුක්ත නොවන ලෙස චූදිතයාට අවවාද කරන ලෙස සහ විනය පරීක්ෂණ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස වින්දිතයන් වෙනුවෙන් ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

**වෛද්‍ය වසන්ත බණ්ඩාර**
**ලේකම්**
**දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය**

පිටපත්

1. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා
2. අධ්‍යක්ෂක, කුරුණෑගල ශික්ෂණ රෝහළ

ප්‍රධාන කාර්යාලය : අංක 18, රොඩ්නි පෙදෙස, කෝට්ටේ පාර, බොරැල්ල Head Office : No. 18, Rodny Place, Cottah Rd, Borella
දුරකතන/Tele. : 0112 699666 ෆැක්ස්/Fax : 0112 667512
වෙබ් අඩවිය/Web : www.pnmsrilanka.info ඊ-මේල්/e-mail : pnm@sltnet.lk